සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 9 ශ්‍රේණිය - 2017
## Second Term Test - Grade 9 - 2017

නම : ............................................... **කතෝලික ධර්මය** කාලය : පැය 02 යි.

## I කොටස

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 10 තෙක් ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(1) සිත් හැරීමෙන් පසුව පූර්ණ කැපවීමෙන් යුතුව ජනතාව වෙත සුබාරංචිය ගෙන ගිය අයෙකි.
(i) ශුද්ධවූ ලූක්තුමා (ii) ශුද්ධ වූ මතෙව් තුමා
(iii) ශුද්ධවූ පාවුළු තුමා (iv) ශුද්ධ වූ පේදුරු තුමා

(2) දෙවියන්වහන්සේගේ ගැලවීම ජේසුස් වහන්සේගේ රුධිරයෙන් ලැබී ඇති බව දර්ශණයක් තුලින් හඳුනා ගනිමින් බෞතිස්ම ලැබුවෙකි.
(i) සකේවුස් (ii) නිකදේමුස් (iii) තියෝපිලස් (iv) කොර්නේලියස්

(3) අන්‍ය ජාතීන්ගේ විශ්වාසය නිසා ගැලවීමත්, ව්‍යවස්ථාව තුලින් එයට බාධා කිරිමක් කළ නොහැකි බවත් අවධාරණය කරන්නේ,
(i) ජාකොබ්තුමාගේ දේශනයෙනි. (ii) පේදුරුතුමාගේ දේශනයෙනි.
(iii) ජොහාන්තුමාගේ දේශනයෙනි. (iv) පාවුලුතුමාගේ දේශනයෙනි.

(4) ශුද්ධ වූ මතෙව් තුමා,ශුද්ධ බයිබලයේ ඉතා පැහැදිලි හා වඩාත් ඍජු යැයි සැලකිය හැකි ලෙස අපට ඉදිරිපත් කරන කරුණ වන්නේ,
(i) කිතුණු ජීවිත පැවැත්ම පිළිබඳවයි. (ii) දෙවියන්වහන්සේගේ රාජ්‍ය පිළිබඳවයි.
(iii) අවසාන විනිශ්චය හා සදාතන දිවිය පිලිබඳවයි. (iv) ක්‍රිස්තු ඉගැන්වීම් පිලිබඳවයි.

(5) මිසරයේ ඉශ්‍රායෙල් ජනතාවගේ කටුක අත්දැකීම් පෙන්නුම් කරන්නේ
(i) නුමුහුන් පුප මගිනි. (ii) පාස්කු බැටළුවා මගිනි.
(iii) තිත්ත පලා මගිනි . (iv) මන්නා භෝජනයෙනි.

(6) ප්‍රසාද ස්නාපන මෙහෙයේ ප්‍රධාන කොටස් ගණන,
(i) දෙකකි. (ii) තුනකි. (iii) හතරකි. (iv) පහකි.

(7) " ඔබ මා තුළද මා ඔබ තුලද සිටින්නාක් මෙන් ඔවුන්ද අප තුළ ඒකත්වයක් වන පිණිසත්, ඔබ මා එවා වදාළ බව ලෝකයා විශ්වාස කරන පිණිසත්ය" මෙම ප්‍රකාශනය උපුටා ගනු ලැබුවේ,
(i) පරමණ්ඩල යාච්ඤාවෙනි. (ii) උදය ආරාධනාවෙනි.
(iii) ස්ප්‍රීතු සාන්තු යාච්ඤාවෙනි. (iv) උත්තම පූජක යාච්ඤාවෙනි.

(8) සිංහලයට බිඳී ආ "බයිබලය"යන වචනය සඳහා භාවිතා වු ග්‍රීක වචනය,
(i) බිබ්ලෝස් ය. (ii) මතටේස් ය. (iii) අගපේ ය. (iv) ලෝගෝස් ය.

(9) පංච පුස්තකයට අදාල පොත් අයත් වරණය වන්නේ,
(i) ගණන් කථාව, නික්මයාම, රාජාවලිය, සෙකරියා , ධර්මදේශකයා ය.
(ii) උත්පත්ති, නික්මයාම, විරාවලිය, දානියල්, හිතෝපදේශය ය.
(iii) උත්පත්ති, නික්මයාම,ලෙවි ව්‍යවස්ථාව, ගණන් කථාව, ද්විතීය නිති සංග්‍රහය ය.
(iv) උත්පත්ති,නික්මයාම, ද්විතිය නීති සංග්‍රහය, වීරාවලිය, රාජාවලිය ය.

(10) තෝබිත් හා ජුදිත් යන පොත් ඇතුලත් වන්නේ,

(i) පංච පුස්තකයට ය. (ii) ඉතිහාස පොත් වලට ය.

(iii) ප්‍රඥා සාහිත්‍යයට ය. (iv) ද්විතීය සම්මත ග්‍රන්ථවලට ය.

(ලකුණු 2 x 10 = 20 )

**V අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවල වරහන් තුළ ඇති වචන අතුරෙන් වඩාත්ම නිවැරදි වචනය තෝරා හිස්තැන් පුරවන්න.**

(11) ඇදහිල්ල වනාහි .................................................... වන දේ පිළිබඳ සහතිකය වේ.

(12) කුරුසියේ යාගය මගින් පුරාණ පාස්කු යාගය .............................................................. පත් විය

(13) දොන් බොස්කෝ පියතුමාගේ පණිවුඩය වන්නේ ඇස්,කන්,දිව,සිතුවිලි දමනය කර ගැනිමෙන් .................................. ළඟා විය හැකි බවයි.

(14) ''භාවනාශීලි සොහොයුරියෝ'' යන නිකාය ආරම්භ කරන ලද්දේ ...................................................... ය.

(15) "ඔබ තුමාට මට ප්‍රේම කරමි ජේසුනි" යනුවෙන් පවසා මරණයට පත් වූයේ .................................ය

( පූර්ණත්වයට, සාන්ත තෙරේසා තුමිය, ශුද්ධවන්තභාවයට,ශුද්ධ වූ යුප්‍රේසියාතුමිය,බලාපොරොත්තු )

(ලකුණු 2 x 5 = 10 )

**V වරහන් තුළින් වඩාත් නිවැරදි වචනය තෝරා ඡේදය සම්පූර්ණ කරන්න.**

උන්වහන්සේ තමන් ඇති දැඩි වූ (i) ........................................ (ජෙරුසලෙම්, නාසරෙත් ) නුවරට පැමිණ සිරිත් පරිදි (ii) ........................... (පාස්කු / සබත් ) දවසේදි (iii) .......................................... ( සිනගෝගයට / ධර්මශාලාවට ) වැඩම කර කියවීම පිණිස නැගිට සිටි සේක. එවිට දිවැසිවර (iv) ....................................... (හොසියාගේ / යෙසායාගේ ) ග්‍රන්ථය උන්වහන්සේට දෙන ලද්දේය. උන්වහන්සේ ග්‍රන්ථය (v) ................................. (පරීක්ෂා කර / දිගහැර) මෙසේ ලියා ඇති තැන සොයා ගත් සේක. (vi) ................................. ( දෙවියන්/ස්වාමින් ) වහන්සේගේ (vii) ............................... (වචනය , ආත්මය) මා කෙරෙහි ඇත. මක්නිසාදයත් (viii) .................................. ( වහලුන් / දිළිඳුන් ) හට (ix). ............................. ( පණිවුඩය,සුබාරංචිය) දේශනා කරනු වස් උන්වහන්සේ මා (x) ............................. ( ආලේප,දිරිමත්) කළ සේක.

(ලකුණු 1 x 10 = 10 )

## II කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- කෙටි පිළිතුරු සපයන්න.

(1) (i) ඔබගේ කිතුණු වගකීම් දෙකක් ලියන්න.
(ii) ආත්මික පුණ්‍ය ක්‍රියා දෙකක් ලියන්න.
(iii) නික්මයාම සිද්ධියෙන් ඔබට ලැබෙන පණිවුඩ දෙකක් ලියන්න.
(iv) ජේසුස් වහන්සේගේ ශ්‍රී රුධිරය ලබා ගන්නා ඔබ තුළ දිස්විය යුතු ගුණාංග දෙකක් ලියා දක්වන්න.
(v) චතාරික කාලයේ පවත්වන භක්ති අභ්‍යාස දෙකක් ලියා දක්වන්න.
(vi) දේපල පරිහරණය කිරීම පිළිබඳ ඔබගේ වගකීම් දෙකක් ලියා දක්වන්න.
(vii) අසීසියේ සාන්ත ප්‍රැන්සිස් මුනිඳුන්ගේ "සාමයේ යැදුම" තුළින් ගත හැකි ආදර්ශ දෙකක් ලියා දක්වන්න.
(viii) දේව මාතාවන් සඳහා පවත්වනු ලබන මංගල්‍යයන් දෙකක් ලියා දක්වන්න.
(ix) ගංවතුරින් විපතට පත් වූවන් වෙනුවෙන් කිතුණු ඔබගේ වගකීම් දෙකක් ලියන්න.
(x) ශුද්ධ වූ සභාවේ දේව අනාවරණය වත්මන් ජනතාව වෙත ගෙන යන මුද්‍රිත මාධ්‍ය දෙකක් ලියන්න.
(ලකුණු 2 x 10 = 20 )

(2) (i) දිව්‍ය සත්ප්‍රසාදීය භෝජනය ලබා ගැනීමේදී අප විසින් නිසි සූදානමක් ඇති කර ගත යුතු කොටස් දෙක නම් කරන්න.
(ii) "අගපේ " සාක්ෂිකරුවන් වූ මුල් කිතුණුවන්ගේ ලක්ෂණ තුනක් ලියන්න.
(iii) ගැලවීමේ පණිවුඩය ලොවට ගෙන යාමේ කාර්යයට හවුල්වන අපගේ ජීවිත ගමන කෙසේ විය යුතු ද යන්න කරුණු 5ක් ඇසුරෙන් ලියා දක්වන්න. (ලකුණු 2 + 3 + 5 )

(3) (i) "යමෙක් මා තුළ සිටින්නේද, මා ඔහු තුළ සිටිම්ද ඒ තැනැත්තේ බොහෝ ඵල දරයි " (ජොහාන් 15/4-5) මෙම ප්‍රකාශය හා සම්බන්ධ ගීතිකාවේ මුල් පද කාණ්ඩය ලියා දක්වන්න.
(ii) ක්‍රිස්තුන් වහන්සේගේ අතීන්ද්‍රිය දේහයට සම්බන්ධ වන සමාජ කණ්ඩායම් තුනක් ලියන්න.
(iii) කිතුණු දරුවෙකු ලෙස යහපත් සමාජයක් ගොඩ නැගීමේ කාර්යයට ඔබට දායක විය හැකි ආකාර 5ක් විස්තර කරන්න. (ලකුණු 2 + 3 + 5 )

(4) (i) පුරාණ ගිවිසුමේ හා නව ගිවිසුමේ තේමාවන් වෙන් වෙන් වශයෙන් ලියා දක්වන්න.
(ii) ත්‍රිවිධාකාර වූ දේවානුභාවය නම් කරන්න.
(iii) යහපත් දිවි පෙවතක් ගත කිරීමට දේව වචනයෙන් ඔබට ලැබෙන මග පෙන්වීම් 5 ක් විස්තර කරන්න.
(ලකුණු 2 + 3 + 5 )

(5) (i) සාන්තුවරයන් යනු කවුරුන්ද?කෙටියෙන් ලියන්න.
(ii) මාටින්ද පෝරස් මුනිතුමා හඳුන්වන වෙනත් නම් තුනක් ලියන්න.
(iii) නූතන තරුණ පිරිසට අභියෝගයක් වූ ඇලෝසියුස් ගොන්සාගා මුනිවරයාට අනුව,ඔබගේ ජීවිතය හැඩ ගස්වා ගන්නා ආකාරය කරුණු 5 කින් විස්තර කරන්න. (ලකුණු 2 + 3 + 5 )

(6) (i) ලියෝ නානායක්කාර රදගුරු තුමා අසරණ වූ ජනතාව වෙනුවෙන් කළ සේවාවන් දෙකක් ලියන්න.
(ii) ශුද්ධාත්මයාණන් වහන්සේ හඳුන්වනු ලබන වෙනත් නම් තුනක් ලියන්න.
(iii) ශුද්ධාත්මයාණන්ගේ වරප්‍රසාදයෙන් පූර්ණ වූ ඔබ පාසල තුළ සත්‍යයට සාක්ෂි දරන්නේ කෙසේද යන්න කරුණු 5 ක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 2 + 3 + 5 )

**Answer**

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

දෙවන වාර පරීක්ෂණය - 9 ශ්‍රේණිය - 2017

# Second Term Test - Grade 9 - 2017

කතෝලික ධර්මය පිළිතුරු පත්‍රය

## I කොටස

| | | |
|---|---|---|
| (1) - (iii) | (6) - (i) | |
| (2) - (iv) | (7) - (iv) | |
| (3) - (i) | (8) - (i) | |
| (4) - (iii) | (9) - (iii) | |
| (5) - (iii) | (10) - (iv) | ( ලකුණු 20 ) |

11. බලාපොරොත්තු
12. පූර්ණත්වයට
13. ශුද්ධවන්ත භාවයට
14. ශුද්ධ වූ යුප්‍රේසියා තුමිය
15. සාන්ත තේරේසා තුමිය (ලකුණු 2 x 5 = 10)

(i) නාසරෙත්, (ii) සබත්, (iii) ධර්මශාලාවට (iv) යෙසායාගේ
(v) දිගහැර (vi) ස්වාමින් (vii) ආත්මය (viii) දිළිඳුන්
(ix) සුබාරංචිය (x) ආලේප (ලකුණු 1 x 10 = 10)

## II කොටස

(1) (i) ලියා ඇති පිළිතුර සලකා බලා ලකුණු දෙන්න.
(ii) සාගිනි වූවන්ට ආහාර දීම/ පිපාස වූවන්ට පානය දීම / රෝගීන් බැලීමට යාම / මළවුන් වැළලීම
(iii) දෙවියන් වහන්සේ අප සමග සිටින බව/ උන්වහන්සේගේ අසීමිත ආදරය / නිරන්තරයෙන් අප ශක්තිමත් කරන බව ආදී පිළිතුරු.
(iv) මනුෂ්‍යත්වයට ගරු කිරීම, බෙදා හදා ගැනීමේ ජීවිතයකට හුරුවීම/ යහපත කිරීමෙන් සතුටට පත්වීම / තම කාර්යය අවංකව සතුටින් ඉටු කිරීම වැනි කරුණු,
(v) ශුද්ධ වූ පැය / පාද නමස්කාරය / පසන් ගායනා කිරීම ආදිය
(vi) පොදු දේපලවලට ගරු කිරීම, සුරැකීම, සමසේ පරිහරණය කිරීම
(vii) ප්‍රේම කිරීම / විශ්වාසවන්තව ජීවත් වීම/ බලාපොරොත්තු ඇති කිරීම යැදුම හා සම්බන්ධ කර ලියා ඇති කරුණු වලට ලකුණු ලබා දෙන්න.
(viii) පරිශුද්ධ දේව මාතා මංගල්‍යය/ ශ්‍රී ලංකා අප ස්වාමිදූගේ මංගල්‍යය/ දේව මාතාවන්ට මංගලම් කීමේ මංගල්‍යය / දේවමාතාවෝ පරලොවට වැඩීමේ මංගල්‍යය
(ix) පිළිතුරු සළකා බලා ලකුණු දෙන්න.
(x) ඥාණාර්ථ ප්‍රදීපය / දහම් මග / පහන් ටැඹ ( ලකුනු 20 )

(2) (i) අභ්‍යන්තර සූදානම / බාහිර සූදානම
(ii) යාච්ඤාවේ නිරත වීම / සෑම දේ පොදුවේ තබා ගැනීම / බෙදා හදා ගැනීම / ගෞරවාන්විත භීතිය කින් යුක්තවීම පෙළපොත 48 පිටුව
(iii) ලියා ඇති පිළිතුර සලකා ලකුණු දෙන්න. (ලකුණු 2 + 3 + 5)

(3) (i) වෙමි මම මිදි වැල - පවසමි ඉඳුරා , මිදිවැල මමයි සැබෑ
(ii) බලවතුන් හා දුබලයන් / උගතුන් හා නූගතුන් / පාලකයෝ හා සේවකයෝ පෙළපොත 54 පිටුව
(iii) ලියා ඇති පිළිතුරට අනුව ලකුණු දෙන්න. (ලකුණු 2 + 3 + 5)

(4) (i) පුරාණ ගිවිසුම - දෙවියන් වහන්සේ මෝසෙස් තුමා මගින් ඉශ්‍රායෙල් ජනතාව ගලවා ගැනීම
නව ගිවිසුම - දෙවියන්වහන්සේ මුලු මිනිස් සංහතිය උන්වහන්සේගේ පුත්‍රයා වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ මගින් ගලවා ගැනීම
(ii) ක්‍රියාව / කථනය / ලිඛිතය.
(iii) ලියා ඇති පිළිතුර අනුව ලකුණු දෙන්න. (ලකුණු 2 + 3 + 5)

(5) (i) මෙලොව ජීවිතයේදී දෙවියන් වහන්සේට අවනත වී තම ජීවිතය අන් අය වෙනුවෙන් කැප කරමින් ජීවත්ව දූනුද දෙවියන් වහන්සේ සමග ජීවත් වන අය ( ලියා ඇති පිළිතුරෙහි මෙම අදහස ඇතුලත් වී තිබේනම් ලකුණු දෙන්න)
(ii) සාමයේ දූතයා / දයාවේ දූතයා / සමාජ සාධරණත්වයේ දූතයා
(iii) ඇලෝසියස් ගොන්සාගා මුනිවරයාගේ චරිතය අදාළ කර ගනිමින් ඉදිරිපත් කර ඇති කරුණු සලකා ලකුණු දෙන්න. (ලකුණු 2 + 3 + 5)

(6) (i) වතුවල සේවය කළ කම්කරුවෝ වෙනුවෙන් නව ජීවන ක්‍රමයක් බිහි කිරීම/ පාසල් හැර යන සිසුන් සඳහා කාර්මික මධ්‍යස්ථානයක් පිහිටු වීම.U.S.C.O.D නමින් සමාජ ආර්ථික කාර්මික මධ්‍යස්ථානයක් පිහිටු වීම.
(ii) සහනදායකයාණෝ , සුසුමාණෝ , ආත්මයාණෝ
(iii) ලියා ඇති කරුණු වලට ලකුණු දෙන්න. (ලකුණු 2 + 3 + 5)